කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2012
2015 මාර්තු - මැයි

සමාජීය විද්‍යා පීඨය

මනෝවිද්‍යාව - PSYC - E 2025

වෘවහාරික මනෝවිද්‍යාව

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. ව්‍යවහාරික මනෝවිද්‍යාවේ වර්ධනය කෙරෙහි ඉවහල් වූ මනෝවිද්‍යාඥයන් හා සිද්ධීන් පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

02. "මනෝවිද්‍යා උපදේශනය" (Psychological Counselling) යන්න හඳුන්වා ලාංකික සන්දර්භය තුළ එය ක්‍රියාත්මක කිරීමේ දී මුහුණදීමට සිදුවන ගැටලු පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

03. පුද්ගල සංවර්ධනය සඳහා මනෝවිද්‍යාව යොදාගත හැකි ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 20)

04. **එක්කෝ**
i ශුද්ධ මනෝවිද්‍යාවේ අරමුණු පැහැදිලි කරන්න. (ලකුණු 08)
ii මනෝවිද්‍යා සේවාව තුළ ශුද්ධ මනෝවිද්‍යාඥයන්ගේ කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 12)

**නැතිනම්**
i ව්‍යවහාරික මනෝවිද්‍යාවේ අරමුණු පැහැදිලි කරන්න. (ලකුණු 08)
ii මනෝවිද්‍යා සේවාව තුළ ව්‍යවහාරික මනෝවිද්‍යාඥයන්ගේ සේවාව අගයන්න. (ලකුණු 12)

05. ශ්‍රී ලාංකික සමාජයට ව්‍යවහාරික මනෝවිද්‍යාඥයින්ගේ අවශ්‍යතාව ඔබ හඳුනාගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 20)

06. i "මානසික වයස" (Mental Age) ගණනය කරන ආකාරය පහදන්න. (ලකුණු 04)
ii ඩේවිඩ් වෙස්ලර්ගේ බුද්ධි පරීක්ෂණය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 06)
iii බුද්ධි පරීක්ෂණවල වාසි හා අවාසි පෙන්වා දෙන්න. (ලකුණු 10)

07. i ප්‍රක්ෂේපී පෞරුෂ පරීක්ෂණ හා අප්‍රක්ෂේපී පෞරුෂ පරීක්ෂණ අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 08)
ii ඔබ කැමති ඕනෑම පෞරුෂ පරීක්ෂණ 03 ක ස්වභාවය, අන්තර්ගතය, වාසි හා අවාසි විස්තර කරන්න. (ලකුණු 12)

08. i ධනාත්මක චින්තනය යන්න නිර්වචනය කරන්න (ලකුණු 04)
ii ධනාත්මක චින්තනයේ වාසි මොනවාද?. (ලකුණු 08)
iii ධනාත්මක චින්තනය වර්ධනය කිරීමේ ක්‍රමෝපායන් යෝජනා කරන්න. (ලකුණු 08)

************************